# ඉතාමත් නිහතමානි රාජ්‍යතාන්ත්‍රිකයෙකු හමුවිය.....



උදයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික,
නියෝජ්‍ය විභාග කොමසාරිස්

**රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, මට රාජ්‍යනොවන පුණ්‍ය ආයතනයක් වන, කළුතර බෝධි භාරකාර මණ්ඩලය මගින්, යෝජිත පුස්තකාලය සංවර්ධනය කිරීමේ**
**ව්‍යාපෘතියක නියැලීමට අවස්ථාව ලැබිණ. විශේෂයෙන්ම පුස්තකාලය සම්බන්ධ අධ්‍යාපන වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම මට අයත්වූ ප්‍රධාන වැඩ කොටසක් විය. ප්‍රදේශයේ දානපති පවුලක් විසින් බෝධි භාරකාර මණ්ඩලයට තිළිණයක් වශයෙන් පවරා දෙන ලද 'තිලිණ' නම් ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කරන ලද පුස්තකාලය 'බෝධිඥාන පුස්තකාලය' යනුවෙන් නම් කරන ලදී.**



කළුතර බෝධිඥාන පුස්තකාලය

පුස්තකාලයේ සියලු සංවිධාන කටයුතු අවසන්කර, එය විවෘත කිරීම සඳහා එවකට සිටි රාජ්‍යපරිපාලන ඇමතිතුමාට ආරාධනා කර තිබිණ. ආයතනයේ සභාපති තුමාගේ නිර්දේශය අනුව, එදින රැස්වීමේ විශේෂ දේශනය පැවැත්වීම සඳහා රාජ්‍යසේවයේ ඉතාම උසස්, අග්‍රාමාත්‍ය ලේකම් සහ ජනාධිපති ලේකම් තනතුර කිහිප වරක්ම දරා, විශ්‍රාම සුවයෙන් සිටින ප්‍රභූවරයෙකුට ආරාධනා කරණ ලදී. ඔහු ආරාධනය සතුටින් පිළිගත් බව හැරෙන තැපෑලෙන් දන්වා එවීය. ඔහු සභාවට හඳුන්වා දීමේ කාර්යය මා වෙත පැවරිණ. මෙම භාරදුර කාර්යය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම පිණිස මට ඔහු හමුවීමට සිදුවිය.

ආයතනයේ සභාපති තුමාගෙන් ලබාගත්, එතුමාගේ දුරකථන අංකයට කථාකර, ඔහුගේ ලිපිනය ලබාගෙන, හමුවීමට දිනයක් සහ වේලාවක් නියම කර ගතිමි.
නියමිත දින, කතිකා කරගත් වේලාවට මා එහි යන විට, ඔහු මා බලාපොරොත්තුවෙ-න් නිවසේ ආලින්දයේ සිටියේය. මා සාදරයෙන් පිළිගත් ඔහු ආගිය තොරතුරු කථාකර, තමන් විසින් මෑතදී ලියා පළකරන ලද පොත් දෙකක් මට පෙන්වා 'මම මේ පොත් දෙක පුස්තකාලයට තෑගි කරනවා.' කියා පොත් මා අතට දුන්නේය. ඉංග්‍රීසියෙන් ලියා පළකර තිබුණු පොත් දෙක මෙසේය.




01. Rendering Unto Caesar(A Fascinating Story of One Man's Tenure under Nine Prime Ministers and Presi-dents of Sri Lanka

02. "Kalutara – An Odyssey"

මට තේ කෝප්පයකින් සංග්‍රහ කළ එතුමා, ඉතාමත් සුහදශීලීව 'ඔය පුස්තකාලයේ කටයුත්ත සඳහා මගෙන් දැනගන්නට ඕනෑ මොනවද?' කියා ඇසී ය. එතුමා ඇසූ ප්‍රශ්නයට 'රාජ්‍යසේවයේ ඉහලම තනතුරේ දිගු කාලයක් සිටි ඔබ තුමාගේ අත්දැකීම් තරුණ පරම්පරා-වට හරි වටිනවනේ' කියා මම ක්ෂණික පිළිතුරක් දුන්නෙමි.




'මා ගැන ඒ තරම් කියන්නට දෙයක් නැහැ. මමත් ඔය කළුතර පැත්තේම කෙනෙක්. මගේ උපන් ගම කළුතර, පයාගල. මම මුලින්ම ඉගෙන ගත්තේ කළුතර හෝලි ක්‍රොස් විද්‍යාලයේ' එම තොරතුරු මම කලින් දැන නොසිටියෙමි. මට අවශ්‍යතාවය තිබෙනුයේ පුස්තකාලය විවෘත කිරීමේ මහා සභාවේ ආරාධිත දේශකයා වන ඔහු හඳුන්වාදීම බව මම ඊ ළඟට කීවෙමි. 'එහෙනම් මගේ ගම් ප්‍රදේශයේ ජනතාවත් ඔය රැස්වීමට එනවා ඇතිනේ. ඒක නිසා මා ගැන බොහෝ දෙනෙක් නොදන්නා අලුත් යමක් කියමු.' කියමින් ඔහු මා අසලම පුටුවක හිඳ ගත්තේය. එතුමාගේ රසවත් විස්තරය ඔහුගේ වචන වලින්ම මෙසේය.
'මම මගේ මවගෙන් සහ වෙනත් වැඩිහිටියන් ගෙන් අහලා තියෙන තොරතුරුත් එක්ක උපන් දවසේ සිටම, මගේ කතාව ටිකක් කියන්නම්. මගේ තොරතුරු ඔයාගේ වැඩේට ගැලපෙන විදිහකට තෝරා බේරා ගන්න. මම උපන්නේ 1930 අවුරුද්දේ ඔක්තෝබර් 20 වෙනිදා, කොළඹ පෞද්ගලික රෝහලක. ඒ කාලේ මගේ පියාගේ රැකියාව නිසා දෙමාපියන් පදිංචිවෙලා සිටියේ කොළඹ. මා උපන් රෝහලට එදා උදෙන්ම පැමිණි මගේ පියා, මා දැක බලාගත් ගමන්, හදිසි කටයුත්තක් තිබෙන බව කියා ඉක්මණට පිටවී ගියාලු.'
'ඒ වේලාවේ අම්මාගේ ඇඳ අසල සිටි අපගේ ආච්චි ඇතුළු අනිකුත් නෑදෑයින් ද තාත්තා හදිසියේම පිටවී යාම ගැන මහත් පුදුමයට පත් වෙලා. ඒ උනත් ඒ කවුරුවත් හදිසි කටයුත්ත ගැන ප්‍රශ්න කර නැහැ.'

එතුමා කියන්නට සුදානම් වන කතන්දරය පාසල් දරුවන්ද රාශියක් සහභාගී වීමට නියමිත, පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයේ ප්‍රධාන අමුත්තා හඳුන්වා දීමේ හේතු පාඨය සඳහා සඳහා, මෙම විස්තරය කොයි තරම් දුරට ගැලපේ දැයි මට සැකයක්ද ඇතිවිය.
'සර් මේ පොත් දෙක ගැනත් යමක් දැනගන්නට ලැබුණොත් ඒවාත් පුස්තකාලය භාවිත කරන අයට හුඟක් ප්‍රයෝජනවත් වේවි.' කියා, විස්තරය වෙනත් පැත්තකට යොමු කරවීම සඳහා ප්‍රයත්නයක් දැරීමට මම උත්සාහ කළෙමි.

'ඒ ගැන පස්සේ කතා කරමු. මම කියන්නට යන මේ විස්තරය නැතිව මා ගැන හැඳින්වීම සම්පූර්ණ වෙන එකක් නැහැ.' කියමින් එතුමා නැවතත් මෙසේ විස්තර කරන්නට පටන් ගත්තේය.

'මගේ පියා ඒ කාලෙත් ක්‍රිකට් පිස්සෙක්ලු. ඒ කාලයේ දැන් වගේ රූපවාහිනී රූප පෙට්ටි තිබුනේ නැහැනේ. මේ නිසා රාජකාරියෙන් නිවාඩු ලබාගෙන හෝ, කොළඹ පැවැත්වෙන ප්‍රධාන පෙළේ සෑම ක්‍රිකට් තරඟයක්ම පාහේ බැලීමට යාම ඔහුගේ ප්‍රියතම විනෝදාංශය වෙලා තිබුණාලු.' 'ඔහු ඉතාමත් ප්‍රිය කරන, ලෝකයේ නම් දරාපු ක්‍රිකට් ක්‍රීඩකයෙක් එදා ලංකාවට ඇවිත්. තාත්තා කලබලෙන්ම ගොස් තිබෙන්නේ එදා සවසට, තාත්තාද සාමාජිකයෙක්ව සිටි ක්‍රිකට් සංගමය මගින්, හදිසියේම ඒ ක්‍රීඩකයා වෙනුවෙන් සංවිධානය කර තිබුණු සාදයකට සහභාගි වී ඔහු දැක බලා ගැනීමටයි.'

මම සාවධානව අසාගෙන සිටියෙමි. මේ කතාව මගේ අවශ්‍යතාවට කෙතරම් දුරට ගැලපේද යන්න මට තවමත්
ප්‍රහේලිකාවකි.

'එදා උපන් මා යන්තමට දුටු තාත්තා, ඒ විගසම, හදිසි කටයුත්තක් සඳහායයි ඉක්මණින්ම පිටවී ගොස් තිබෙන්නේ, එදින ලංකාවට පැමිණ සිටි ලෝකප්‍රකට ඕස්ට්‍රේලියානු ක්‍රිකට් ක්‍රීඩක ඩොන් බ්‍රැඩ්මන්ව දැක බලා ගැනීම සඳහා යි.' කී ඔහු, සිනහ සෙමින්, මඳක් කල්පනා කරන්නට විය.

ඕස්ට්‍රේලියාව සහ එංගලන්තය අතර පවත්වන 'අළු බඳුන' (Ashes) මහා ක්‍රිකට් තරඟාවලිය, 1930 වසරේදී පවත්වා ඇත්තේ එංගලන්තයේය. එහිදී පවත්වන ලද ටෙස්ට් තරඟ පහෙන්, දෙකක් ඕස්ට්‍රේලියාව දිනාගත් අතර එකකින් පරාජයට පත්වී ඇත. ඉතිරි තරඟ දෙක ජය පරාජයකින් තොර වී තිබේ. මේ නිසා තරඟ වාරයේ ජය ඔස්ට්‍රේලියාව විසින් අත්පත් කරගෙන තිබුණි. මෙම තරඟාවලිය ජයග්‍රහණයේ වීරයා වී තිබුණේ, ඕස්ට්‍රේලියාවට ජයග්‍රහණය ලබා ගැනීම සඳහා, අගනා පිති හරඹයක යෙදෙමින් ලකුණු විශාල සංඛ්‍යාවක් ලබාගත් ඩොන් බ්‍රැඩ්මන්ය. මෙය එකළ ශ්‍රී ලංකාවේ පත්‍ර වාර්තාවක සඳහන් කර තිබී ඇත්තේ මෙසේය.

*"Australia won the 1930 Ashes series against England" winning two of the matches and losing one" with the other two tests drawn. Don Bradman had been the highest scorer' This particular tour will always be remembered by reason of the amazing batting successes which attended the efforts of Bradman."*

ඔහු තම කථාව තවදුරටත් කරගෙන ගියේය. 'එදින සවස ආපසු පැමිණි පියා (තවමත් පහවී නොගිය ක්‍රිකට් උද්දාමයෙන් යුතුව) ඒ දිනවල ලෝකයේ ජනප්‍රියම ක්‍රිකට් ක්‍රීඩකයා වී සිටි, ඕස්ට්‍රේලියානු ජාතිකයාගේ නම පුංචි පුතා වන මටද දැමීමට තීරණය කරලා. මේ තීරණයට කිසි කෙනෙක් විරුද්ධ වෙලා නැහැ' 'ඔන්න ඔහොමයි සිංහල මට, අපේ පවුලේ වාසගමත් එක්ක බ්‍රැඩ්මන් වීරකෝන් කියන නම ලැබුණේ.' මෙසේ කියමින් ඔහු මඳ සිනහවක් පා මාදෙස බලා සිටියේය. සියල්ල කෙටියෙන් සටහන් කර ගත් මම 'හරි අපූරු කතාවක්නේ. මම උත්සවය දාට මේ විස්තරය කිසි අඩුවක් නැතිව කියවන්නම්'

20 වන පිටට